# පරිසර අමාත්‍යාංශය
# சுற்றாடல் அமைச்சு
# Ministry of Environment

"සොබාදම් පියස", අංක 416/සී/1, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"சொபாதம் பியச", இல. 416/சீ/1, ரொபர்ட் குணவர்தன மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Sobadam Piyasa", No. 416/C/1, Robert Gunawardana Mawatha, Battaramulla, Sri Lanka.
Gen. Tel. +94-11-2034100

ලේකම් / செயலாளர் / Secretary +94-11-2034121

ෆැක්ස් / தொலை நகல் / Fax +94-11-2879944


මගේ අංකය / எனது இல / My No: MOE/07/EDU-TR/02/WED/22

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2022.05

(19)

**පරිසර චක්‍රලේඛ 01/2022**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියළුම ප්‍රධාන ලේකම්වරුන්
සියළුම රාජ්‍ය ලේකම්වරුන්
සියළුම පළාත් ලේකම්වරුන්
සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සියළුම පළාත් පාලන ආයතන ප්‍රධානීන්
සියළුම රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**ජගත් පරිසර දින සැමරුම් වැඩසටහන - 2022 ජූනි 05**

සොබාදහම හා මිනිසා අතර වෙන් කළ නොහැකි සමීප සබඳතාවන් පැවතිය ද පසුකාලීනව අසීමිත මිනිස් අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා සිදු කළ අයහපත් මානව ක්‍රියාකාරකම් හේතුවෙන් උද්ගත වූ පාරිසරික ගැටළු සමස්ත ජීවීන්ගේ පැවැත්මට දැඩි තර්ජනයක් වී ඇත.

විශේෂයෙන්ම මෑත කාලයේදී ඇති වූ කෝවිඩ් 19 වැනි වසංගතය මානව සංහතිය පුරා ව්‍යාප්ත වීමත් සමග පරිසරය හා මානව ක්‍රියාකාරකම් අතර වඩා තිරසර සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමේ අවශ්‍යතාවය සමස්ථ ලෝකයටම වැඩි වශයෙන් දැනී ඇත.

02. පාරිසරික ගැටළු සම්බන්ධව ලෝක ප්‍රජාවගේ අවධානය යොමු කිරීමේ අදිටනින් 1972 වර්ෂයේ දී ස්වීඩනයේ ස්ටොක්හෝම් නුවරදී පැවති ජාත්‍යන්තර පරිසර සමුළුවෙහිදී ගන්නා ලද තීරණයකට අනුව බිහි වූ **එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ** (UNEP) සමාරම්භක දිනය සැමරීම උදෙසා, සෑම වසරකම **ජූනි 05 ජගත් පරිසර** දිනය වශයෙන් නම් කර ඇත. එහිදී පරිසර සංරක්ෂණය පිළිබඳව ලෝකවාසී ජනතාව දැනුවත් කිරීමට හා පාරිසරික ගැටළු පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ අවධානය යොමු කිරීමේ අරමුණින්, එක් එක් වර්ෂයන්හිදී විශේෂිත තේමා යටතේ ජගත් පරිසර දිනය සමරනු ලබයි. ඒ අනුව එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන විසින් මෙම වසරේ ජගත් පරිසර දින තේමාව ලෙස **" only one earth"** යන්න ඉදිරිපත් කර ඇත.

03. 2021 නොවැම්බර් 18 දින ස්වීඩන් රජය විසින් 2022 ජගත් පරිසර දිනය එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන (UNEP) සමඟ එක්ව සත්කාරත්වය ලබා දී සැමරීමට කටයුතු සූදානම් කර ඇත. මෙවර ජගත් පරිසර දිනය ලෝක ප්‍රජාවටම සුවිශේෂී අවස්ථාවක් ලෙස සලකා සැමරීමට අවස්ථාව උදාවනු ඇත. ඒ ස්වීඩනයේ ස්ටොක්හෝම් නුවරදී පැවති මානව පරිසරය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය පැවැත්වූ 1972 වර්ෂයේ සිට 2022 දක්වා වසර දක්වා 50 වැනි සංවත්සරය **(Stockholm+50 )** සනිටුහන් කොට ගෙන සැමරීමද සිදු කරන බැවිනි.

04. ඒ අනුව පරිසර අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් ශ්‍රී ලංකාවේ ද මෙවර ජගත් පරිසර දිනය **"මිහිතලය එකම නිවහනයි"** යන තේමාව යටතේ සැමරීමට කටයුතු යොදා ඇත

05. වර්තමානයේදී දේශගුණික විපර්යාස, ස්වාභාවික උපද්‍රව සහ පරිසර දූෂණය යන ත්‍රිත්ව අර්බුදවලට මිනිසාට අඛණ්ඩව මුහුණ දීමට සිදු වී ඇත. එබැවින් යුහුසුළුව පෘතුවියෙහි පවතින සීමිත සම්පත් මානව වර්ගයා විසින්ම ආරක්ෂා කර නැවත සවිබල ගන්වා ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා සොබාදහම හා මිනිසා අතර පොදු කතිකාවකට කැදවන ගෝලීය වේදිකාව බවට ලෝක පරිසර දිනය පත් කරගැනීමට අදිටන් කරගත යුතුව ඇත.

06. මේ සඳහා, "ජගත් පරිසර දින සැමරුම් වැඩසටහන" යන මැයෙන් යුතුව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව ජගත් පරිසර දින ජාතික උත්සවයට සමගාමීව **"ජාතික පරිසර සතියක්"** ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව මෙම වර්ෂයේ ද මැයි 30 සිට ජුනි 05 දක්වා සතිය "ජාතික පරිසර සතිය" ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර එම දිනයන් පහත පරිදි නම් කර ඇත.

- මැයි 30 පරිසරය පවිත්‍රතා හා කසළ කළමනාකරණ දිනය
- මැයි 31 වායු දූෂණය අවම කිරීමේ දිනය
- ජුනි 01 ජලය හා ජල මූලාශ්‍ර සංරක්ෂණ දිනය
- ජුනි 02 ජෛව විවිධත්වය සංරක්ෂණ දිනය
- ජුනි 03 පරිසර සංරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ දිනය
- ජුනි 04 තිරසර ඉඩම් කළමනාකරණ දිනය
- ජුනි 05 ජගත් පරිසර දින සැමරුම සහ රුක් රෝපණ දිනය

07. මේ අනුව සියළුම ආයතන ප්‍රධානීන් විසින් තම කාර්ය මණ්ඩලය ද, විදුහල්පතිවරුන් විසින් තම විදුහලේ ගුරුභවතුන් සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ද ජගත් පරිසර දිනයේ වැදගත්කම පිළිබඳව දැනුවත් කිරීම, කාර්යාල හා පාසල් පරිශ්‍ර පවිත්‍ර කිරීමේ ශ්‍රමදාන පැවැත්වීම, කසළ වර්ගීකරණය කර (ප්ලාස්ටික්/ පොලිතීන් / කඩදාසි / වීදුරු / ලෝහ / කාබනික ද්‍රව්‍ය ලෙස) විධිමත් අයුරින් බැහැර කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදීමෙන් එම කටයුතු පවත්වාගෙන යාම සහ පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

08. එසේම දිවයින පුරා පළාත් පාලන ආයතනවල මූලිකත්වයෙන් එම පළාත් පාලන බල ප්‍රදේශ තුළ, පරිසරය පවිත්‍ර කිරීම, කසළ වර්ගීකරණය හා කසළ කළමනාකරණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර පවත්වා ගෙන යාම ඇතුළු පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

09. තවද ජාතික පරිසර සතිය තුළදී රාජ්‍ය ආයතන, පාසල්, පෞද්ගලික අංශය, වැවිලි සමාගම් හා වතු ක්ෂේත්‍රය, රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් සංවිධානවල මූලිකත්වයෙන් ප්‍රජාවගේ සහභාගීත්වයෙන් පහත කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු බව පෙන්නුම් කරනු කැමැත්තෙමි.

i. ලස්සන, පවිත්‍ර රටක් නිර්මාණය කිරීම එක් එක් නිවසින් ආරම්භ කිරීමේ වැදගත්කම සහ පරිසර සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම
ii. තිරසර ගෙවතු වගා ප්‍රවර්ධනය කිරීම
iii. ප්‍රදේශයට අනුව හරිත රැකියා හඳුනා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
iv. පොලිතීන් හා ප්ලාස්ටික් භාවිතය අවම කිරීම සහ පරිසර හිතකාමී ඇසුරුම් ප්‍රවර්ධනය
v. විධිමත් කසළ කළමනාකරණ ක්‍රමවේදයන් අනුගමනය කිරීම
vi. අප අවට වාතයේ පිරිසිදු බව පවත්වාගෙන යාමෙන් ලැබිය හැකි වාසි, වායු දූෂණය තුළින් ඇතිවිය හැකි අහිතකර තත්ත්වයන් සහ පරිසර සංරක්ෂණයේ වැදගත්කම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම

vii. වන ආවරණය ඉහළ නැංවීමට ක්‍රියාකිරීම හා ග්‍රාමීය මට්ටමින් සහ ආයතන මට්ටමින් රෝපණ ද්‍රව්‍ය සුලභ කිරීම සඳහා පැළ තවාන් ඇති කිරීම

viii. ජලපෝෂක, රක්ෂිත ප්‍රදේශ, ගංගා ඉවුරු, තෙත් බිම් ප්‍රදේශ වැනි පරිසර සංවේදී භූමි හඳුනා ගැනීම හා ඒවා සංරක්ෂණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ix. හානියට පත් භූමි පුනරුත්ථාපනය, පාංශු සංරක්ෂණය හා තිරසර ඉඩම් කළමනාකරණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

x. ජෛව විවිධත්ව සංරක්ෂණය සඳහා කටයුතු කිරීම

xi. හරිත වෙරළ සංකල්පයට අනුව වෙරළ තීරයේ තුරු ආවරණය වැඩිදියුණු කිරීම හා වෙරළ කලාප පවිත්‍ර කිරීම

xii. වෙරළ පරිසර පද්ධති තිරසර කළමනාකරණය හා කඩොලාන සංරක්ෂණයට ක්‍රියාමාර්ග ගැනීම

10. සෑම ආයතනයක් විසින්ම ඉහත යෝජිත පරිදි සුදුසු පරිසර සංරක්ෂණ වැඩසටහන් ජාතික පරිසර සතිය තුළදී ඉටුකිරීම සඳහා පූර්ව සැලසුම් සකස් කර ආයතනයේ සියළු දෙනාගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කිරීම සුදුසු බව වැඩිදුරටත් දන්වා සිටිමි.

11. ජාතික පරිසර සතිය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය https://drive.google.com/drive/folders/1N9evbvEQzZOX_OkCGDN-pf1K46M0O_fC?usp=sharing සබැඳිය මඟින් හෝ එසේ සිදුකිරීමට අපහසු අවස්ථාවකදී දෘඩ පිටපතක් මඟින් පරිසර අමාත්‍යාංශය වෙත වාර්තා කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

12. ඉදිරි වර්ෂයන්හිදී ජාතික පරිසර සතිය ක්‍රියාත්මක කිරීම සහතික කරනු වස් එම වැඩසටහන් තම ආයතනවල, දිස්ත්‍රික්කවල හෝ පළාත්වල වාර්ෂික සැලසුම්වලට ඇතුළත් කර ගැනීමට ක්‍රියාකරන මෙන් ද කාරුණිකව දන්වා සිටිමි.

13. මෙම කාර්යයන් සිදු කිරීමේදී 2022.04.26 දිනැති 03/2022 ජාතික අයවැය චක්‍රලේඛයේ ප්‍රතිපාදනවලට අදාළව ක්‍රියාකරන ලෙසද දන්වා සිටිමි.

පරිසර සංවේදී ප්‍රජාවක් බිහිකිරීම සඳහා ඔබ දක්වන සහයෝගය අතිශයින් අගය කරමි.

වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්

පිටපත්

01. ජනාධිපති ලේකම් - කරු. දැ.ගැ.ස
02. අග්‍රාමාත්‍ය ලේකම් - කරු. දැ.ගැ.ස
03. අමාත්‍ය මණ්ඩල ලේකම් - කරු. දැ.ගැ.ස